## බළන්ගොඩ නගර සභාව

## 2025.12.30 දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2025.12.30**

**වේලාව -පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති කේ. ජී ප්‍රේමදාස මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | කේ. ජී ප්‍රේමදාස මැතිතුමා |
| 2. ගරු උප සභාපති | පේෂල නිකලන්ද මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම් රුමී මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ.එස් චන්දන මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එස්.යූ.සී. ජයනක මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරී ජී.ඩී.ඒ සෝමපාල මිය

මෙදින විශේෂ මහ සභාවේ වැඩ කටයුතු පෙ.ව. 10.00 ට ආරම්භ කළ ගරු සභාපතිතුමන් විශේෂ මහ සභාව සඳහා සහභාගී වූ ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා සහ සභාවේ කාර්ය මණ්ඩලය පිළිගැනීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

01.2026 වර්ෂය සඳහා සභාව පැවැත්වෙන දින තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා පැවසූයේ 2026 වර්ෂයේ සභාව පැවැත්වෙන දින තීරණය කිරීම සුපුරුදු පරිදි දෙවන සතියේ අඟහරුවාදා දින යොදා ගැනීම සිදු කරනවාද යන්න සාකච්ඡා කළ යුතු බවත් ජනවාරි මස සභාව පැවැත්වෙන දිනය ලෙස ජනවාරි 06 වෙනිදා යොදා ගැනීම කළ යුතු බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය සඳහන් කලේ දෙවනි අඟහරුවාදා දිනය යොදා ගැනීමේදී සෑම මාසයකම 13-15 වැනි දිනයන් වන බැවින් එය සංශෝධනයක් සිදු කිරීම සුදුසු බවයි.

ඒ අනුව සභාවේ අදහස්ද අනුව සෑම මසකම දෙවැනි සතියේ අඟහරුවාදා දිනය සභාව පැවැත්වීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපතිතුමන් විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

02. බලන්ගොඩ නගර සභාව සතු පහත සඳහන් කඩ කාමර සඳහා නව තක්සේරු වාර්තා ලබා ගෙන ඇත. අවම වශයෙන් වසර 03 කට වරක්වත් කුලී මුදල් සංශෝධනය කල යුතු බව ප.පා.කො. 01/2023 චක්‍රලේඛය මගින් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව නව තක්සේරුව 2026 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

| අනු අංකය | කඩ වර්ගය | කඩ ප්‍රමාණය | අවසන් වරට තක්සේරුව ක්‍රියාත්මක කල දිනය |
|---|---|---|---|
| 1. | මැණික් කඩ කාමර | 14 | 2023.01.01 |
| 2. | පොදු වෙළෙඳසැල කඩ කාමර / සාප්පු කඩ | 15 | 2023.03.01 |
| 3. | විවෘත කඩ | 21 | 2023.03.01 |
| 4. | පදික කඩ | 28 | 2023.03.01<br>(185/01 සිට 185/19 දක්වා කඩ කාමර වල තක්සේරුව 2024.01.01 දින සිට ක්‍රියාත්මක කර ඇත. |
| 5. | නව පදික කඩ | 31 | 2023.05.01 |
| 6. | මහජන පොල භූමියේ කඩ කාමර | 346 | 2023.01.01 |
| 7. | සම්පත් පියස යාබද කඩ කාමර | 06 | 2023.03.01 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පෙ.ව.10.14ට පමණ ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා සභාවට පැමිණෙන ලදී.

ඉහත සඳහන් නව තක්සේරුවට අදාළව ආදායම් අංශ ප්‍රධානී මඟින් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

නව තක්සේරුවට අදාළව ආදායම් අංශ ප්‍රධානී මඟින් කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව කාරක සභාවේ සාකච්ඡා කළ කරුණු අනුව මහජන පොළ කුටියක් සඳහා ගැසට් නිවේදනයේ සඳහන් ගාස්තුව වන රු.350 මුදල අයකිරීමටත්,තක්සේරු දෙපාර්තමේන්තුව වෙත එම ගාස්තු සංශෝධනය සිදු කර දෙන ලෙස දැනුම්දීමටත්, දක්වා ඇති කඩ කාමර අතුරින් පදික කඩ කාමර අංක 185/01 සිට 185/19 දක්වා කඩ කාමර වල තක්සේරුව 2027.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමටත්, අනෙකුත් සියළු කඩ කාමර වලට නව තක්සේරුව ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් වන ගරු සභාපතිතුමන් විසින් කල යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

03. මාර්ග නඩත්තු කටයුතු සඳහා තාර බැරල් 30ක් මිලදී ගැනීම සඳහා පවත්වන ලද තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය සඳහා අනුමැතිය ලබා ගැනීම.
තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය-
ඉදිරිපත් කර තිබූ මිල ගණන් අනුව තාර බැරල්(180 L) එකක් සඳහා අවම මිල රු.26,200.00+Vat ක් ඉදිරිපත් කර තිබූ GKUC Intrernational ආයතනයෙන් ප්‍රවාහන පහසුකම් සැපයීම් සිදු නොකරන බව දන්වා ඇත.Road Coating Inrernational ආයතනයෙන් තාර බැරල් එකක් සඳහා රු. රු.26,650.00+Vat ඉදිරිපත් කර තිබුනද එම ආයතනයෙන් ප්‍රවාහන පහසුකම් සපයන බව දන්වා ඇත.ප්‍රවාහන වියදමත් සමඟ සැසඳීමේදී Road Coating Inrernational ආයතනයෙන් තාර බැරල් මිලදී ගැනීම වඩා ලාභදායී බව පැහැදිලි විය.ඒ අනුව වැයවන අවම මිල පිළිබඳ සලකා තාර බැරල් 30 Road Coating Inrernational ආයතනයෙන් මිලදී ගැනීම සුදුසු බව තාක්ෂණික ඇගයීම් කමිටුව තීරණය කර ඇත.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**04.ටෙන්ඩර්පත් හා මිල ගණන් විවෘත කිරීම.**

මෙදිනට නියමිත ටෙන්ඩර්පත් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමී මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත්කරන ලදී. අනතුරුව ටෙන්ඩර් මණ්ඩලය විසින් ගනු ලැබූ පහත සඳහන් තීරණ ගරු සභාපතිතුමන් විසින් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

**04.01** බළන්ගොඩ නගර සභාවට අයත් අංක 01,02,03,06,07,08,09 සහ 10දරණ දැන්වීම් පුවරු බදුදීමට සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර්පත් විවෘත කිරීම.

බළන්ගොඩ නගර සභාවට අයත් ඉහත ටෙන්ඩර් දැන්වීම් 2026.01.01 දින සිට 2026.12.31 දින දක්වා වර්ෂයක කාලයකට බදුදීමට සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර්පත් කැඳවීමේදී අයදුම්පත් 01ක් පමණක් නිකුත් වී තිබූ අතර ඩී.කේ.කේ ලක්මාල් මහතා විසින් එම අයදුම්පත ඉදරිපත් කර තිබුණි.ඒ අනුව එම මහතාගේ ලංසු මුදල වූ රු.25,000 මුදල සභාවේ අවම ලංසු මුදල වූ රු.24,000ට වැඩි වූ නිසාත් එම මහතා ඉදිරිපත් කළ ලංසු මුදල පිළිගැනිමත් හේතුවෙන් ඩී.කේ.කේ ලක්මාල් මහතා වෙත ඉහත ටෙන්ඩරය පිරිනැමීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

**04.02** පළාත් පාලන මාර්ග සංවර්ධනය -2025 වැඩසටහන යටතේ ප්‍රතිපාදන වෙන් වී ඇති බළන්ගොඩ අක්කර 18 මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ ටෙන්ඩර්පත් විවෘත කිරීම.

බළන්ගොඩ නගර සභාව සතු අක්කර 18 මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීම සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමට ප්‍රසිද්ධ පුවත්පත්වල ටෙන්ඩර් දැන්වීම් පළ කළ අතර ඒ වෙනුවෙන් ටෙන්ඩර්පත් 04ක් නිකුත් වී තිබූ අතර අදාළ ලංසු මුදල් පහත පරිදි ඉදිරිපත් කර තිබුණි.

| කොන්ත්‍රාත්කරු | ඉදිරිපත් කර ඇති ලංසු මුදල(රු.) |
|---|---|
| සැම් ඩැම් ඉංජිනියරින් | 7,126,878.00 |
| අනුර කන්ස්ට්‍රක්ෂන් | 9,068,422.60 |
| OK කන්ස්ට්‍රක්ෂන් | 7,081,743.00 |
| තිරන කන්ස්ට්‍රක්ෂන් | 7,399,802.09 |

එම ආයතන ඉදිරිපත් කරන ලද මිල ගණන් අතුරින් බළන්ගොඩ අක්කර 18 මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය කොන්ත්‍රාත් ලබාදීමට සුදුසු ආයතනය තෝරා ගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කිරීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

ටෙන්ඩර් මණ්ඩලය විසින් ගන්නා ලද ඉහත ටෙන්ඩර් මණ්ඩල තීරණ ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කළ අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**11.** **අවසානය**

අනතුරුව ගරු සභාපතිතුමා අද දින ගරු සභාව වෙත සහභාගී වී අද්දින විශේෂ මහ සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය, කාර්ය මණ්ඩලය සඳහා වෙතද ස්තූතිය පුදකරමින් පෙ.ව.11.24 ට පමණ මෙදින විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

**කේ. ජී.ජේමදාස,**
සභාපති,
බළන්ගොඩ නගර සභාව.